# විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව 2009-05-11

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2009.05.11

වේලාව : පෙ.ව.10.45

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

01. ගරු සභාපති ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා
02. ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
03. ගරු නගර සභා මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
04. ගරු නගර සභා මන්ත්‍රී එම්.ටී.එම්. රූමි මැතිතුමා
05. ගරු නගර සභා මන්ත්‍රී යූ.එච්. ගාමිණී මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය:-**

01. නාගරික ලේකම් - ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

අද දින පැවැත්වෙන විශේෂ මහ සභා රැස්වීම සඳහා සහභාගීවීමට පැමිණ සිටින, නාගරික මන්ත්‍රීතුමන්ලා, හා ලේකම්තුමා ගරු සභාපතිතුමා විසින් සාදරයෙන් පිළිගන්නා ලදී. ඉන් අනතුරුව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, අද දින මෙම විශේෂ මහ සභා රැස්වීම කැඳවීමේ අරමුණු , 2009.04.30 වන දින පැවති මහ සභා රැස්වීමට ඉදිරිපත් කරනු ලැබූ රු.10000/- ට වැඩි මුදල් ගෙවීම් අනුමත කරගැනීම බවත්, එදින මුදල් ගෙවීම් වල පැවති අඩුපාඩු හේතුවෙන් සභාව විසින් මුදල් ගෙවීමට වලට අනුමැතිය ලබානොදුන් බවත්, නමුත් අද දින මෙම සභා රැස්වීමට එම අඩුපාඩු නිවැරදි කර ඉදිරිපත් කර ඇති බවත් පැවසීය.

( මෙම අවස්ථාවේ දී අදාල විෂය භාර නිලධාරිණිය සභාවට කැඳවා කරුණු විමසූ අතර, මින් ඉදිරියට තමන්ගේ රාජකාරිය වඩාත් සැලකිලිමත්ව සහ වගකීමෙන් යුතුව ඉටුකිරීමට පියවර ගන්නා ලෙස උපදෙස් ලබාදෙන ලදී .)

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ පිළිසරු ජාතික ව්‍යාපෘතියෙහි මූල්‍ය අනුග්‍රහයෙන් රුපියල් ලක්ෂ 78 ක පමණ වියදමක් දරා නිම කරන ලද බළන්ගොඩ නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියෙහි කාබනික පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානය විවෘත කිරීමේ උත්සවය 2009.05.28 වන දින පාරිසරික හා ස්වභාවික සම්පත්

ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ අතින් විවෘත කිරීමට කටයුතු කරන බවත් පැවසීය. එම උත්සවය සංවිධානය කිරීම සඳහා මුදල් වැයවන බැවින්, ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලෙසට ද යෝජනා කරන ලදී.මෙම උත්සවය නිසා 2009.05.28 වන දින පැවැත්වීමට නියමිත මාසික මහ සභා රැස්වීම 2009.05.29 වන දින පැවැත්වීමට කටයුතු බව දන්වමින් ඉතිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

03. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම් /පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

03:01 **බළන්ගොඩ නව නගර සංවර්ධන ව්‍යාපෘතිය:**

බළන්ගොඩ බස්නැවතුම්පල ඉදිරිපස පදික වෙළඳාමට යොදා ගනු ලබන කුටි සඳහා සැලසුම් ඉදිරිපත් කරන බව දන්වමින්, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ( ව්‍යාපෘති කළමනාකරණ ) විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදුව, එම සැලසුම අනුමත කල සභාව, ඒ සඳහා යන වියදම ගණනය කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කිරීමට තීරණය කරන ලදී.

03:02 **බළන්ගොඩ කාර්පාක් කඩ කාමර වල කුලී තක්සේරු කරගැනීම:**

උක්ත කරුණට අදාළව , මෙම සභාව විසින් යවන ලද ලිපියකට අනුව අදාල කඩ කාමර සඳහා දැනටමත් නගර සභාව විසින් අයකරනු ලබන කුලී එළෙසම අයකිරීමට කටයුතු කරන ලෙසත්, වසර 03 කට පසු කුලී ප්‍රතිශෝධනයක් සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසත්, දැනට අයකරනු ලබන කුලියේ ප්‍රතිශෝධනයක් අනවශ්‍ය බවත් දන්වමින්, තක්සේරු දෙපාර්තමේන්තුවේ පළාත් තක්සේරුකරු ( මහ කොළඹ ) විසින් එවා ඇති ලිපියක් ගරු සභාවේ දැනගැනීම සඳහා සභාගත කරන ලදී.

03:03 **ආදේශක පුස්තකාල සහයිකා තනතුර:**

උක්ත කරුණට අදාළව, නෙල්කා නිරෝෂණී යන අය විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදුව, මේ සම්බන්ධව ඊළඟ සභා රැස්වීමේ දී තීරණයක් ගැනීමට සභාව අනුමත කරන ලදී.

03:04 **බැංකියවත්ත කාබනික පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානය විවෘත කිරීම:**

බැංකියවත්ත කසල කළමනාකරණ ව්‍යාපෘතිය විවෘත කිරීමේ උත්සවයට අදාළ සංග්‍රහ කිරීම, ආරාධනා කිරීම,පළක සැකසීම හා අනෙකුත් සියළු කටයුතු සඳහා වැයවන මුදල් සභා අරමුදලින් දැරීමට සභාව අනුමැතිය ලබාදෙන ලදී.

**04. මුදල් ගෙවීම් අනුමත කිරීම (රු.10000/ ට වැඩි ගෙවීම් )**

**( 2009.03.26 සිට 2009.04.28 දින දක්වා )**

| | |
|---|---|
| 01. තුරුල් S.A.F.E එන්වයර්මන්<br>මල අපද්‍රව්‍ය පිරිසිදු කිරිමේ පද්ධතිය සඳහා coconut fiber කෙඳි ලබා ගැනීම වෙනුවෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරිමට ප්‍රථම 50% අත්තිකාරමක් ලබා ගැනීම. | 604200.00 |
| 02 එච් එල් ඩබ්ලිව් ඉංජිනියරින් සර්විස්<br>226- 7521 ටිපර් රථයේ එන්ජින් අලුත්වැඩියා කිරිමට අවශ්‍ය අමතර කොටස් මිළදී ගැනීම. | 28571.40 |
| 03. එච් එල් ඩබ්ලිව් ඉංජිනියරින් සර්විස්<br>226-7521 ටිපර් රථයේ එන්ජින් අලුත්වැඩියා කිරිමට අවශ්‍ය අමතර කොටස් මිළදී ගැනීම | 24045.50 |
| 04 සාමාන්‍යාධිකාරි ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>2009.02.25 සිට 2009.02.27 දක්වා ඉන්ධන බිල පියවීම | 42242.20 |
| 05. සාමාන්‍යාධිකාරි ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>2009.02.09 සිට 2009.02.24 දක්වා ඉන්ධන බිලපියවීම | 73867.40 |
| 06. ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>2009 ජනවාරි නාගරික මන්ත්‍රී බිල පියවීම<br>2287023 - 2554.83<br>2287022 - 1476.95<br>2288565 - 409.00<br>2287024 - 6409.84<br>2288400 - 4157.43<br>0602452931 - 2421.83<br>0602452932 - 694.42 | 18124.29 |
| 07. එස්. එම් ලංකා ට්‍රේඩිංප්‍රයිවට් ලිමිටඩ්<br>ND 5124 වෑන් රථයට ඉදිරිපස බ්‍රේක්පැඩ් එකක් මිළදි ගැනිම | 15751.00 |
| 08. ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ්<br>විධායක පුටුවක් කබඩ් 04 ඇඳි පුටු 06 මිළදී ගැනීම | 117342.19 |
| 09. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය<br>පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ගාස්තු | 40000.00 |

10 .හර්ෂණ කලර් සෙන්ටර් 232536.26
කාර්යාලය පුස්තකාලය ආයර්වේදය ගලි ප්‍රතිකාරක පද්ධතියේ
මායිම් තාප්ප බුලත්ගම වැසිකිලියේ තින්ත ආලේප කිරිම

11. LANC හාඩ්වෙයාර් සහා අයන් වර්ක්ස් 68967.31
මල ප්‍රවාහන ප්‍රතිකර්ම පද්ධතිය ඉදිකිරිම කර්මාන්තයේ
වැඩ කොටස් අංක 2හි DRY BED යටතේ අංක 6-7-8-9-10-11-12-
13- 14 වැඩ කොටස් නිම කිරිමේ කර්මාන්තය

12. LECC මෙටල් ක්‍රෙෂර්
137695.00
බැංකියවත්ත කසල කලමණාකරණ පද්ධතියේ ඉදිකිරීම්
බස් නැවතුම් පල බැම්ම ඉදි කිරිම සදහා අවශ්‍ය ගල් ලබා ගැනීම

13. H .L..P ටිම්බර් ඩිලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර් 29789.10
බුලත්ගම වැසිකිලිය කොම්පෝස්ට් ව්‍යාපෘතිය ප්‍රිම්ස් යාඩ් අසල
ආයුධ ගබඩාව බැංකියවත්ත පීල්ල සදහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම.

14. J.F ඩිස්ට්‍රිබියුටර්ස් 41322.15
බැංකියවත්ත කසල කලමණාකරණ පද්ධතියේ ඉදිකිරීම්
කටයුතු සදහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම.

15. WANC හාඩ්වෙයාර් සහා අයන් වර්ක්ස් 127746.00
කර්මාන්ත අංශය සදහා අවශ්‍ය 1 1/4 GI බට 60 මිලදි ගැනීම.

16. H. D රුවන් ප්‍රේමසිංහ. 400000.00
විශ්‍රාම වැටුප් පාරිශෝතිකයෙන් කොටසක් ගෙවීම.

17. රිෂානා සර්විස් ස්ටේෂන් 14380.00
වාහන සේවා කිරිම සදහා.

18. w.u.A ජයන්ත. 16800.00
ඉදිකිරිම් සදහා අවශ්‍ය ගල් LECC මෙටල් ක්‍රෙෂර් ආයතනයේ
සිට වැඩබිම දක්වා ප්‍රවාහනය කිරීමේ ගාස්තු

19. දාස ට්‍රේඩ් සෙන්ටර් 16440.00
සෞඛ්‍ය අංශය සදහා ගම් බූට්ස් ජෝඩු 12 මිලදි ගැනිම.

20. සභාපති , ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාව 150000.00
ආයුර්වේදය සදහා ඖෂධ ලබා ගැනිම.

21. එච්.එල්.ඩබ්ලිව්. ඉංජිනියරින් සර්විස් 10040.00
ප්‍රිමික්ස් ඇනිම සදහා භූමිතෙල් ලීටර 200 මිලදී ගැනීම.

22. පතිරාජ එන්ටප්‍රයිසස් 48510.00
තානායම සදහා උළු ලබා ගැනීම.

23. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක 49461.77
2009 ජනවාරි සහා පෙබරවාරි මාස වලට අදාල බිල්පත් ගෙවීම.

24. සිරි විජය ග්‍රාම සංවර්ධන සමිතිය 173490.38
තුඹගොඩ කෝපිවත්ත ජල යෝජනා ක්‍රමය ඉදිකිරීම කර්මාන්තයේ
අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම.

25. බී. ගුණරත්න 86708.00
2009.03.16 ද 2009.03.31 දක්වා කසල එකතු කිරීමේ දීමනා ගෙවීම.

26. සාමාන්‍යාධිකාරි ඉඹුල්පේ විවිධ සේවා සමිතිය 71997.40
2009.02.26 සිට 2009.03.09 දක්වා ඉන්ධන බිල පියවීම

27. රිචඩ් ප්‍රැන්සිස් 29475.00
බැංකියවත්ත සදහා අවශ්‍ය වැලි කියුබ් 09 ලබා ගැනීම.

28. කැන්ඩි ටිම්බර් ඩලර්ස් 46777.50
තානායම අලුත්වැඩියාව වෙනුවෙන් අගල් 9 පළල සපු ලෑලි

දිග අඩි 450 ක් සැපයීම.

29. එම්.ජී. පියසේන 19500.00
පෞද්ගලික බස් ගාල් ගාස්තු තැන්පත් ආපසු ගෙවීම. 2009 මාර්තු මාසය.

30. ඊ. එම්. ජී. කරුණාරත්න ඔෆ්සෙට් මුද්‍රණාලය. 47272.50
න.ස . 3 පොත් 200
පෞද්ගලික බස් ගාල් ගාස්තු පොත් 200
ආදායම් උප පත්‍රිකා 50 සඳහා ගාස්තු ගෙවීම.

31. ජේ. ජී.පී වික්‍රමසිංහ. 16110.00
2009 මාර්තු මාසයේ කියවීම් ශාලාවට හා පුස්තකාලයට පුවත්පත් සැපයීම වෙනුවෙන් ගෙවීම.

32 .දේශානී හාඩ්වෙයාර් 31732.41
බුලත්ගම සුසාන භූමිය බලන්ගොඩ නව බස් නැවතුම් පල අසල බැංකියවත්ත ව්‍යාපෘතිය සඳහා ජල සැපයුමට අවශ්‍ය උපාංග මිලදී ගැනීම.

33. ටී.ඒ.ටී.එච් තෙබුවන 39105.00
එච්.එෆ්. 8558 ට්‍රැක්ටරයේ අලුත් වැඩියා කටයුතු සඳහා.

34. ටී.ඒ.ටී.එච් තෙබුවන 24354.90
එච්.එෆ්. 2269 ට්‍රේලරයේ අලුත් වැඩියා කටයුතු සඳහා.

35. එම්. ගාමිණි 20394.00
226-7521 ටිපර් රථයේ එන්ජිම අලුත් වැඩියා කිරීම.

36. ආර්.ජී. ගුනපාල 18700.00
2009.03.11 සිට 2009.04.06 දක්වා ප්‍රිමික්ස් නිෂ්පාදන වඩී 340 සඳහා.

37. ඉන්දික එරික් සිසිල් 15885.00
නගර සභා පෙර පාසලේ අවුරුදු උත්සවය වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම.

38. .LECC මෙටල් ක්‍රෂර් 62585.20
බැංකියවත්ත කසල කලමණාකරණ පද්ධතියේ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම ප්‍රිමික්ස් නිෂ්පාදනය තානායම අලුත්වැඩියාව සඳහා අවශ්‍ය ගල් ලබා ගැනීම.

1 1/2 ගල් කියුබ් 01
3/4 ගල් කියුබ් 04
1/2 ගල් කියුබ් 7.4
4X4 ගල් කියුබ් 4.64

39. සාමාන්‍යධිකාරි ඉඹුල්පේ විවිධ සේවා සමිතිය 38500.00
කර්මාන්ත සඳහා අවශ්‍ය සිමෙන්ති ලබා ගැනීම.

40. ඉන්දික එරික් සිසිල් 14000.00
කර්මාන්ත අංශය සඳහා උළු 2200 වයික්කාල සිට බලන්ගොඩ දක්වා ප්‍රවාහණය කිරීම.

41. ආර්.ජී. ගුනපාල 12600.00
ප්‍රිමික්ස් නිෂ්පාදනය සඳහා දර යාර 21 සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම.

42. බී. ගුණරත්න 15000.00
කසල එකතු කිරීමේ තැන්පත් ආපසු ගෙවීම.

43. සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම 10678.50
නව නගර කඩ කාමර ටෙන්ඩර් කිරීමේ පුවත්පත් දැන්වීම සඳහා

44. සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම 14125.00
නව නගර කඩ කාමර ටෙන්ඩර් කිරීමේ පුවත්පත් දැන්වීම සඳහා

45. බී. ගුණරත්න 86708.00
2009.04.01 ු 2009.04.15 දක්වා කසල එකතු කිරීමේ දීමනා ගෙවීම.

46. WANC හාඩ්වෙයාර් සහා අයන් වර්ක්ස් 31086.00
ගලි ප්‍රතිකාරක පද්ධතියේ පී.වී.සී.නල සිදුරු කිරිම හා වගා භූමියට
දැල් ආවරණ යෙදීම වෙනුවෙන් ගෙවීම.

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී.

04. **මිළ ගණන් සලකා බැලීම**:

ජී.කේ.6227 ට්‍රැක්ටරය සේවා කිරීමට අවශ්‍ය ෆිල්ටර් මිළදී ගැනීමට
දේව් ට්‍රැක්ටර් සමාගමෙන් ලබාගත් මිළ ගණන් සභාවට ඉදිරිපත් කරන ලදී.

| **ෆිල්ටර් වර්ගය**: | **එකක මිළ** : |
|---|---|
| ඔයිල් ෆිල්ටර් 01 ක් | 1100.00 |
| ඩීසල් ෆිල්ටර් 01 ක් | 3850.00 |

ඉහත මිල ගණන් පිළිගත් සභාව, ඔයිල් ෆිල්ටර් 06 ක් හා ඩීසල් ෆිල්ටර් 04 ක් මිළදී ගැනීමට අනුමැතිය ලබාදෙන ලදී.

05. **ඇස්තමේන්තු අනුමත කිරීම**:

05:01 සුදර්ශනපුර රාජපක්ෂ මහතාගේ නිවස අසල
හියුම් පයිප්ප බෝක්කු දමා කාණු ඉදිකිරීම රු.92291.07

05:02 පල්ලෙකුඹුර මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම රු.207760.24

05:03 කිරිදිගල රබර්වත්ත පාර මැද කොටස කොන්ක්‍රීට් කිරීම හා
කාණුව බැම් බැඳීම
රු.110684.82

( මෙම කර්මාන්ත අනුමත සමිතියක් මගින් ඉටුකිරීමට තීරණය කරන ලදී.

05:04 බුලත්ගම තලාව පාර දකුණු පස මාර්ගය
ඉදිකිරිම

මෙම කර්මාන්තය අනුමත සමිතියක් මගින් ක්‍රියාත්මක
කිරීමට ද්‍රව්‍ය පමණක් ලබාදීමට තීරණය විය. රු.284426.12

05:05 දේගපිටිය පාර අළුතින් ඉදිකල පාලම අසල බැම්
බැඳ කාණු සාදා බාධවකින් තොරව ජලය ගලා
යාමට සැකසීම රු.30004.16

05:06 කිරිදිගල,මහකුඹුරට යන පාර පාලම ඉදිකිරීම රු.171957.86
මෙම කර්මාන්ත දෙකෙහි ඇස්තමේන්තු සභාව
විසින් අනුමත කරන ලදී.

06. **අවසානය** :

ගරු සභාපති,ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා:

අද දින සභා රැස්වීමට සහභාගී වු ගරු මන්ත්‍රීතුමන්ලා සියළු දෙනාටත්, ලේකම් මහතාටත් සිය ස්තුතිය පිරිනමමින් පෙ.ව.11.45 ට පමණ රැස්වීමේ කටයුතු නිමාවට පත්කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.